Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2023 නොවැම්බර් 13, කොළඹ

# නෙස්ලේ නෙස්ටොමෝල්ට් 2023 සමස්ත ලංකා පාසල් තරගාවලියේ මැරතන් තරඟ බලගන්වයි

අධ්‍යාපන අමාත්‍යංශය හා එක්ව නෙස්ලේ නෙස්ටොමෝල්ට් සංවිධානය කරන ලද සමස්ත ලංකා පාසල් තරගාවලියේ මැරතන් තරඟ ඉසව් ඉකුත් නොවැම්බර් 11 වැනිදා ගාල්ලේදී සාර්ථකව නිමාවිය. මෙම මැරතන් තරඟ ඉසව්, සෑම වසරකම පැවැත්වෙන සමස්ත ලංකා පාසල් තරඟ මාලාවේ ඉතා වැදගත් තරඟ අංශයක් වේ.

ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම මෝල්ට් පානය වන නෙස්ලේ නෙස්ටොමෝල්ට් විසින් බලගැන්වූ මෙම මැරතන් තරඟ සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයක්ම නියෝජනය කරමින් දක්ෂ පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ රැසක් සහභාගී වූහ. එහිදී අර්ධ මැරතන් තරඟය (කි.මී. 21) සඳහා සියලු පළාත් නියෝජනය කරමින් තරඟකරුවන් 300කට වැඩි පිරිසක් සහභාගී වූ අතර ප්‍රදර්ශනාත්මක මැරතන් තරඟයට (කි.මී. 5) 1400 කට වැඩි පිරිසක් එක්වූහ.

'Good food, Good life' තේමාව කරගත් නෙස්ලේ ලංකා සමාගමෙ ප්‍රමුඛතම සන්නාමය වන නෙස්ටොමෝල්ට් 'අරමුණු බලගැන්වීම' යන අභිලාෂය ශාක්ෂාත් කරමින්, ශ්‍රී ලාංකිකයින් හට නීරෝගීමත් ක්‍රියාශීලී ජීවන රටාවකට මඟපෙන්වමින්,, අඛණ්ඩව තිස්පස් වසරක් ශ්‍රී ලංකාවේ දැවැන්තම මැරතන් තරඟාවලි සඳහා කොටස් කරුවෙකු වී ඇත.

"සැබෑ ශ්‍රී ලාංකීය සන්නාමයක් ලෙස සමස්ත ලංකා පාසල් මැරතන් තරඟ සඳහා අපගේ සහයෝගය ලබාදෙමින් අපගේ දක්ෂ තරුණ ක්‍රීඩකයින් බලගැන්වීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙනවා. විශේෂයෙන්ම තරුණ ක්‍රීඩකයින්ට තමන්ගේ ක්‍රීඩා දිවිය ඇරඹීම සඳහා මෙසේ අවස්ථාවක් සලසා දීමට අධ්‍යාපන අමාත්‍යංශය සමඟ එක්ව කටයුතු කිරීමට ලැබීම අපට මහත් සතුටක්. මෙවැනි අවස්ථා හරහා ඉදිරියේදීත් පරපුරෙන් පරපුරට ශ්‍රී ලාංකික පවුල් සහ ප්‍රජාව වෙත ධනාත්මක වෙනසක් ඇතිකිරීම වෙනුවෙන් අපි කටයුතු කරනවා", යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කිරි ආහාර අංශ අධ්‍යක්ෂ රුවන් වැලිකල මහතා පැවසුවේය.

සමස්ත ලංකා පාසල් තරගාවලියේ මැරතන් තරඟ ඉසව් දෙකක් යටතේ තරඟකරුවන් 1,700 කට වැඩි පිරිසක් එක්ව සිටි අතර තරඟ ඉසව් ප්‍රතිඵල මෙසේය.

**කි.මී. 21 අර්ධ මැරතන් තරඟය (බාලක)**

පළමු ස්ථානය: පී.ඒ.ඩී.ජී. පෙරමුණ - විද්‍යරාජ විද්‍යාලය, රත්නපුර
දෙවන ස්ථානය: එස්. කරීන් - මුලන්කාවිල් මධ්‍ය මහා විදුහල, කිලිනොච්චි
තෙවන ස්ථානය: ඊ.ජී. ලසිත් ප්‍රදීප් - උක්පිටිය මධ්‍ය මහා විදුහල, ඌව

**කි.මී. 21 අර්ධ මැරතන් තරඟය (බාලිකා)**

පළමු ස්ථානය: ඩබ්.ඩී.ඩී. රංගදරී කුමාරසිංහ - ශ්‍රී දේවානන්ද මධ්‍ය මහා විදුහල, වැලිමඩ
දෙවන ස්ථානය: ඩී.එම්. චමිලා සිරිවර්ධන - සේනාපති මධ්‍ය මහා විදුහල, මොනරාගල
තෙවන ස්ථානය: එල්.පී.ජී. පබෝධා ඉමාෂනී - වැලිමඩ මධ්‍ය මහා විදුහල, ඌව

**කි.මී. 5 මාර්ග ධාවන තරඟය (බාලක)**

පළමු ස්ථානය: ඩබ්.එච්. කවිඳු මධුෂාන් - කඹුරාවල ජාතික පාසල

දෙවන ස්ථානය: ඒ.ඒ. කල්හාර - වලගෙදර මධ්‍ය මහා විදුහල
තෙවන ස්ථානය: එෆ්. මලිඳු ප්‍රභාංජන - වලගෙදර මධ්‍ය මහා විදුහල

**කි.මී. 5 මාර්ග ධාවන තරඟය (බාලිකා)**
පළමු ස්ථානය: කේ.වයි. චමින්දි - මාකඳුර මධ්‍ය මහා විදුහල
දෙවන ස්ථානය: එම්.ඩී. තරුෂි උදාරා - ආනන්ද ශාස්ත්‍රාලය, මතුගම
තෙවන ස්ථානය: කේ. සමින්දි සචින්දයා - නිමල මරියා බාලිකා පාසල, ජාඇළ

මෙරට වෙළෙඳපොළේ පවතින නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි අති නවීන නෙස්ලේ කර්මාන්තශාලාවේදී නිෂ්පාදනය කරනු ලබයි. නෙස්ලේ සමාගම, වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකිකයන් හට සමීප වූ සමාගමකි. නෙස්ලේහි ප්‍රමුඛතම සන්නාමය වන නෙස්ටොමෝල්ට් යනු වසර 60කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික පවුල්වල විශ්වාසය සහ ආදරය දිනූ නිෂ්පාදනයකි. ශ්‍රී ලංකාවේ පමණක් නිෂ්පාදනය කෙරෙන නෙස්ටොමෝල්ට්, මෝල්ට් බාර්ලි සහ කිරි යහගුණයෙන් ද, අත්‍යවශ්‍ය පෝෂක වලින් ද සරු ශ්‍රී ලංකාවේ ජනාදරය දිනාගත් ප්‍රමුඛතම මෝල්ට් ආහාරයයි.

---

**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |